ගම්පොල නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 02 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ගම්පොල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත ඉවත් කළ ලී බඩු හා උපකරණවල වටිනාකම රු.65,044 ක් වුවත්, රු.3,257,730 ක් ගිණුමෙන් ඉවත් කිරීම හේතුවෙන් ලී බඩු හා උපකරණ රු.3,192,686 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී අම්බුළුවාව හරිත මං තීරුව ඉදිකිරීම සඳහා රු.2,300,000 ක ප්‍රතිපාදනවලින් රු.1,205,699 ක වියදමක් දරා තිබූ අතර, අවිච්ඡේද කර නොතිබියදී රු.2,300,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදීත් ණයගැති හා ණයහිමි ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති එකතු වටිනාකම රු.314,721 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි එකතු වටිනාකම රු.495,046 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි රු.2,575,851 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඊ) ජ'නල් සටහන් 51 අනුව ගබඩා ලෙජරයේ වටිනාකම රු.37,068 ක් වුවත්, එය පොදු ලෙජරයේ රු.196,498 ක් ලෙස සටහන් කර තිබුණි.

(උ) සමුච්චිත අරමුදල් ගිණුමේ බැර එකතුව රු.4,086,147 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශනවල රු.4,027,972 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.58,175 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.289,851 ක් වටිනා තැන්පත් 7 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවති රු.10,075 ක් වටිනා මුද්‍රිත අයිතම 3 ක් අවසාන තොගයට ඇතුළත් කර නොතිබුණි.

(ඒ) වාර්ෂික ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.102,639 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් ලැබිය යුතු පොලී ආදායම රු.102,639 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

-----------------------

විවිධ හේතූන් මත සභාව විසින් පවරන ලද නඩු 7 ක් හා පෙර ලබා දී තිබූ නඩු තීරණ සඳහා බාහිර පාර්ශවයන් විසින් කරන ලද අභියාචනා නඩු 5 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට විභාග වෙමින් පැවතුණ ද, මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.49,240,508 ක් වූ ගිණුම් ශේෂ 2 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.2,713,836 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක වටිනාකම රු.94,554,363 ක්වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.64,789,879 ක් වී තිබුණි.

(ii) විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.42,063,401 ක ශේෂය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගලි බැහැර කිරීමේ ඇප ගාස්තු ලෙස ලබාදී ඇති රු.25,000 ක මුදල වර්තමානයේ ගලි බැහැර නොකරන බැවින් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2011 වර්ෂයේදී ලබාදී තිබුණු රු.35,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේදී ද පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක වටිනාකම රු.42,078,560 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල වටිනාකම රු.16,634,642 ක් වී තිබුණි.

(ii) ආසියානු සංවර්ධන බැංකු ණය සඳහා ගෙවිය යුතු රු.497,132 ක ශේෂය පියවීමට කටයුතු නොකර දිගින් දිගටම ගිණුම්වල ඉදිරියට ගෙන එමින් තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.46,533,202 ක් වූ ගනුදෙනු 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

---------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 නගර සභා ආඥා පනතේ 36(ඉ) වගන්තිය | - | සභාව සතු නීතිඥ කාර්යාල සංකීර්ණය, ලංගම බස් නැවතුම්පළ සාප්පු සංකීර්ණය හා ගම්පොල දුම්රිය මාර්ගයට ඉහළින් ඇති වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි බදු දීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් 2000 අංක 53 හා 1988 අංක 56 දරන පාරිසරික පනත | - | සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 131 කට බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2010 පෙබරවාරි 03 දිනැති අංක ආර්/ඩී/1/4/5/43 දරන ජනාධිපති ලේකම්ගේ රජයේ ඉඩම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 3.5 වගන්තිය හා නගර සභා පනතේ 36 (ඉ) (ii) වගන්තිය | - | පළාත් පාලන ආයතනයකට පැවරුම් නියෝගයක් යටතේ හෝ වෙනත් ආකාරයෙන් පවරා ඇති ඉඩම්වල පරම අයිතිය රජය සතුවන අතර, එවැනි ඉඩමක් තෙවන පාර්ශවයකට බැහැර කිරීමට පළාත් පාලන ආයතනවලට බලයක් නොමැති වුවත්, ගම්පොල නගර සභාවේ බලධාරීන් සභා තීරණ මත ඉඩම් බැහැර කිරීමට කටයුතු කර තිබුණි. |
| (ඈ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ | | |
| | (i) 01 ඡේදය | 96,226,998 | පොදු වෙළඳපළ කඩ කාමර සංකීර්ණයෙහි කඩ කාමරවල එකවර ගෙවන ටෙන්ඩර් මුදල් අය නොකිරීම හේතුවෙන් මුල් අවස්ථාවේ හා 2016 වර්ෂයේ ටෙන්ඩර් කරන ලද කඩ කාමරවලින් එක්වන් මුදල් අය කර ගෙන නොතිබුණි. |
| | (ii) (04) ඡේදය | - | පොදු වෙළඳ සංකීර්ණයේ අංක 70 සිට 80 දක්වා කඩ කාමර ටෙන්ඩර් කර ලබා දී ඇති |

නමුත් ව්‍යාපාරික කටයුතු සිදු නොකර වසා දමා ඇති අතර, කුලී මුදල් අය කිරීම සඳහා බිල් කිරීම් සිදුකර නොතිබුණි.

(iii) 04 (1) වගන්තිය - හිඟ කඩ කුලී වෙනුවෙන් ප්‍රමාද ගාස්තුවක් අය කළ යුතු වුවත්, කඩකුලී ප්‍රමාද වීම සඳහා එම උපදෙස් අනුගමනය කර නොතිබුණි.

(iv) 10 ඡේදය - බදුකරුවන් විසින් කඩ කාමර විවිධ පුද්ගලයන් වෙත අතුරු බදුදීම සිදුකර එකවර ගෙවීමේ මුදල් සමඟ වැඩි කුලී මුදලක් අයකර තිබුණද, සභාවට ගෙවිය යුතු කුලී මුදල් ගෙවා නොතිබුණි.

(v) 12 ඡේදය - බදුකරුට අවසරයකින් තොරව කඩ කාමරවල ස්වරූපය වෙනස් කිරීම කළ නොහැකි වුවත්, පදික වෙළඳ සංකීර්ණයේ මහල් 2 කින් යුක්ත වූ අංක 06 දරන කඩ කාමරය ඉහල මහලට ප්‍රවේශ වීමට ඇති පඩිපෙල කඩා ඉවත් කර තනි මහලක් ලෙස භාවිතා කරමින් පැවතුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,726,508 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,092,129 ක් විය.

2.2 මූල්‍ය පාලනය
------------------

(අ) වසර 5 ක සිට වසර 12 ක් දක්වා කාලපරිච්ඡේදයකට අදාළ රු.569,500 ක් වටිනා අගරු චෙක්පත් පවතින නමුත් ඒ සඳහා මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සම්පත් පියස මධ්‍යස්ථානය භාරකරු ලෙස යොදවා තිබූ මුරකරු වෙත 2017 වර්ෂයේදී අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමට අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,190,000 | 63,788,716 | 30,823,412 | 49,005,556 | 31,800,000 | 31,220,467 | 35,750,114 | 46,721,088 |
| කුලී | 9,209,000 | 10,971,699 | 8,052,966 | 13,748,091 | 13,355,000 | 8,336,018 | 7,024,221 | 10,829,358 |
| බලපත්‍ර ගාස්තු | 550,000 | 2,959,154 | 2,959,154 | - | 2,775,000 | 2,668,976 | 2,668,976 | - |
| වෙනත් ආදායම් | 36,248,457 | 9,064,551 | 29,697,547 | 3,032,358 | 51,498,457 | 48,693,104 | 33,479,598 | 15,315,505 |
| | 49,197,457 | 86,784,120 | 71,533,079 | 65,786,005 | 99,428,457 | 90,918,565 | 78,922,909 | 72,865,951 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු කඩ කාමර බදු දීමේදී එකවර අයකර ගැනීමේ මුදල් (key money) කාලීනව අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් සභාවට ලැබිය යුතු ආදායම අහිමි වී තිබුණි.

(ආ) සභාව සතු වත්කම් තක්සේරු කිරීමකින් හා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව බදු දී තිබුණි.

2.3.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.42,126,439 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අයකර තිබුණේ රු.10,716,237 ක් පමණි. රු.31,570,400 ක් වූ වාර්ෂික බිල් කිරීම්වලින් රු.7,585,975 ක් පමණක් වර්ෂය තුළ අයකර ගෙන තිබූ අතර, එය මුළු බිල් කිරීම්වලින් සියයට 24 ක් වැනි ඉතා අඩු අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු වරිපනම් හිඟය රු.44,965,309 ක් විය.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති වරිපනම් හිඟ අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.4 කුලී

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.10,829,358 ක හිඟ කඩකුලී ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.1,586,798 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 14 ක අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී ශේෂය රු.11,610,704 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1 සිට 5 දක්වා කාලයකට අදාළ රු.9,242,560 ක් විය.

(ආ) නීතිඥ කාර්යාල සංකීර්ණයෙන් රු.304,589 ක මාසික බදු කුලී හිඟයක් පැවතුණි.

2.3.5 වෙනත් ආදායම්
------------------

(අ) තානායම් ගාස්තු
-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි තානායම් ගාස්තු ශේෂය රු.856,950 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයකට පෙර සිට පැවත එන රු.24,607 ක් විය.

(ආ) පොදු වැසිකිළි ගාස්තු
-------------------------

වසර කීපයක සිට ඉදිරියට ගෙන එන පොදු වැසිකිළි ගාස්තු ශේෂය රු.1,375,457 ක් වූ අතර, එම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.30,549,410 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1 කාර්යසාධනය
------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-------------------

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 7 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම
----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 4 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම
---------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 38 කින් 29 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම නිසා කර්තව්‍යයන් 9 ක් ඉටු කළ නොහැකි වී තිබුණි.

(ඈ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා රු.2,000,000,000 ක මුදලක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍ය | ඉටුකළ ප්‍රමාණයේ වටිනාකම | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| පොදු වෙළඳපළ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2,000,000,000 | මහල් 3 කින් යුත් පොදු වෙළඳපළ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර මහල් 2 ක් ඉදිකර තිබුණු අතර, සැලසුමේ දුර්වලතා හේතුවෙන් එම මහල් දෙකද ඌන උපයෝජිතව පැවතුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 13 ක් ගතවී ඇතත්, ඉහළ මහල ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර, කොන්ක්‍රීට් කොටස් පුපුරා එම ස්ථානවලින් වැසි ජලය කාන්දු වීම් පැවතුණි. |

(ඉ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

පොදු වෙළඳපළ ඉදිකිරීම සඳහා රු.2,001,374,926 ක් වැය කර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍ය | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| පොදු වෙළඳපළ කඩ කාමර බදු දීම | 2,001,374,926 | ටෙන්ඩර් මඟින් බදු දී තිබුණු පොදු වෙළඳපළ කඩ කාමර 102 ක් ව්‍යාපාරික කටයුතු කිරීමෙන් තොරව වසා දමා තිබූ අතර, වසා දමා ඇති කඩ කාමර විවිධ විෂමාචාර ක්‍රියාවන් සඳහා යොදාගෙන තිබුණි. තවද, අංක 112 සිට 134 දක්වා කඩ කාමර බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණි. |

(ඊ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| කර්තව්‍ය | ඇස්තමේන්තු පිරිවැය | ආරම්භ කළ දිනය | 2017 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| කුඩමාකේ නගර සභා සුළු සේවක ගම්මානයේ අඩි පාරවල් හා කාණු | 1,000,000 | 2017.12.15 | 387,691 | • අධික වර්ෂාව<br>• ස්ථානයේ පවතින දැඩි අපවිත්‍රතාවය |

කොන්ක්‍රීට් කිරීම

- වැඩබිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය විවිධ පුද්ගලයින් විසින් රැගෙන යාම

(උ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතුවන කසළ ටොන් 20 ක පමණ ප්‍රමාණය කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ හා මහනුවර මහ නගර සභාවේ කොම්පෝස්ට් අංගනවලට කසළ යැවීම සඳහා කසළ ගාස්තු වෙනුවෙන් රු.2,278,650 ක මුදලක් 2017 වර්ෂයේදී වැය කර තිබුණි.

(ii) අනුමත ව්‍යාපෘති වාර්තාවක් රහිතව රු.3,325,195 ක වියදමක් දරා ''සම්පත් පියස'' ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර, මෙමඟින් නොදිරන කසළ මිලදී ගෙන ගබඩා කර තිබුණි. 2017 වර්ෂයේදී නොදිරන කසළ කිලෝග්‍රෑම් 17808 ක් මිලදී ගෙන තිබූ නමුත්, විකිණීමට කටයුතු නොකිරීම හේතුවෙන් කිලෝග්‍රෑම් 10210 ක පමණ කසළ තොගයක් මධ්‍යස්ථානය තුළ එකතු වී තිබුණි.

(ඌ) පාරිසරික ගැටළු

--------------------

ඉකුත් වර්ෂවලදී අම්බුළුවාවේ ජෛව විවිධත්ව සංකීර්ණයට කසළ බැහැර කිරීම හා වරින් වර පස් දමා වැසීම සිදුකර තිබුණි. මෙම කසළ දැමූ ස්ථානය 2016 වර්ෂයේදී නාය යාම හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාව විසින් රු.3,433,500 කට ආසන්න වන්දියක් ඉල්ලා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර තිබුණි. ඒ අනුව ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමෙන් තොරව පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි.

(එ) තිරසාර සංවර්ධන ඉලක්ක

--------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

------------------------------------

(i) අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී සේවක අතිරික්තතා 12 ක් හා සේවක ඌනතා 32 ක් විය.

(ii) සෞඛ්‍ය අංශයේ අනුමත සේවක සංඛ්‍යාව අනුව සුළු පරිපාලක සංඛ්‍යාව 3 ක් වුවත්, 7 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර, මෙම සුළු පරිපාලකවරුන්ට අමතරව සෞඛ්‍ය කම්කරු සේවයේ සේවකයින් 8 දෙනෙකු ද සුළු පරිපාලක තනතුරු සඳහා අනුයුක්ත කර 2017 වර්ෂය සඳහා රු.1,670,832 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි. මෙම සේවකයින්ට දෛනිකව නිත්‍ය රාජකාරී වේලාව තුළ ඉටු කිරීමට ප්‍රමාණවත් රාජකාරියක් ද පවරා නොතිබුණි.

(iii) අනුමත කාර්යාල කාර්ය සහායක තනතුරු ප්‍රමාණය 06 ක් වුවද, 10 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර, ඊට අමතරව මාර්ග හා සෞඛ්‍ය කම්කරු තනතුරු දරන සේවකයන් 7 දෙනෙකු කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ආ) සේවක ණය

----------------

(i) ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගෙන් අයකර තිබුණු රු.361,485 ක ණය වාරික අදාළ ආයතනවලට යැවීමට කටයුතු නොකර වර්ෂයකට වැඩි කාලයක සිට ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(ii) වර්ෂ 01 සිට වර්ෂ 17 දක්වා කාලපරිච්ඡේදයක් තුළ නිලධාරීන් 23 කගේ අය නොවී පවතින රු.467,870 ක හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් පොදු වෙළඳපොළෙහි කඩ කාමර 5 ක් මාළු වෙළඳාම සඳහා දීර්ඝකාලීන බදු පදනම මත වසර 10 ක් සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලබා දී තිබුණි. මෙම කඩ කාමර බදුදීමේදී එකවන් මුදල් (key money) එකවර අයනොකර වාරික 60 කින් ගෙවීමට ඉඩ සලසා දීම හේතුවෙන් 2018 ජනවාරි 19 වන දින විට බදු දී වසර 5 ක් ගතවී ඇතත්, රු.4,140,521 ක එක්වන් මුදල් හා නව තක්සේරුව අනුව කඩ කුලී රු.468,000 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ලංගම බස් නැවතුම අසල සාප්පු සංකීර්ණයේ සම්පූර්ණ තක්සේරු වටිනාකමෙන් 1/3 ක් නගර සභාවට අයවිය යුතු ලෙස ගිවිසුම්ගත වී තිබුණද, ගිවිසුම් ප්‍රකාරව කුලී අය නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,114,747 ක මුදලක් නගර සභාවට අයවීමට තිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර සඳහා වසර 5 කට වරක් කුලී තක්සේරු කළ යුතු වුවද, පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අවසන් වරට තක්සේරු කර තිබුණේ 2008 වර්ෂයේදී බැවින් නගර සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) පදික වෙළඳසැල කඩ සංකීර්ණයේ ඉහළ මහල, පහළ මහල බදුගත් බදුකරුටම බදු ගෙවීමකින් තොරව භාවිතා කිරීමට අවස්ථාව සලසා දී තිබුණි.

(ඉ) නගර සභාව සතු භූමියක හා ගොඩනැගිල්ලක පවතින නීතිඥ කාර්යාල 21 ක් බදු දීමේදී කුලී තක්සේරුවක් නොකර 2006 වර්ෂයේදී රු.500 කටද 2011 වර්ෂයේ නොවැම්බර් 24 දින සිට මහාසභා තීරණයක් මත රු.1,000 බැගින් අය කිරීමට තීරණය කර රු.750 ක මාසික කුලියක් අයකිරීම හේතුවෙන් රු.378,000 ක මුදලක් සභා අරමුදලට අහිමි වී තිබුණි. නීතිඥ කාර්යාල 15 ක වසර 10 ක ගිවිසුම් කාලය 2016 ජනවාරි 30 න් අවසන් වී තිබූ නමුත්, ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නගර සභාව සතු ඉඩම් බදුදීම්වලට අදාළව බදුකරුවන් 19 දෙනෙකුගෙන් අයකරගත යුතු එකවර ගෙවීමේ මුදල් රු.6,914,102 ක් හා බදුකරුවන් 112 දෙනෙකුගෙන් වාර්ෂික බදු කුලී රු.1,776,059.50 ක් අයකර ගෙන නොතිබුණි. මෙම ඉඩම් බදු දීමේදී වර්ෂ 5 කට වරක් බදු මුදල සංශෝධනය කිරීමට හෝ නගර සභා බල ප්‍රදේශවල තක්සේරු බදු මුදල සියයට 50 කින් වැඩිකර බදු මුදල සංශෝධනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(උ) පොදු වෙළඳපළ කඩ කාමර වලින් අයකළ යුතු මාසික කුලියද සභාව විසින් විධිමත්ව අයකර ගෙන නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.13,139,179 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

(ඌ) ගම්පොල දුම්රිය මාර්ගයට ඉහළින් ඉදිකර ඇති වෙළඳ සංකීර්ණයෙන් 2005 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළව රු.9,193,568 ක කඩ කුලියක් අයකර ගැනීමට තිබුණි.

(එ) වර්ෂ 5 කට වරක් සභා දේපළ තක්සේරු කළ යුතු වුවත්, 2008 වර්ෂයේ තක්සේරුව මත 2017 වර්ෂයේදී ද වරිපනම් බදු අය කර තිබුණි. 2008 සිට මේ වන විට බල ප්‍රදේශය විශාල වශයෙන් දියුණු වී තිබුණද, දේපළ තක්සේරු කර වරිපනම් බදු අලුත් නොකිරීම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
-----------------------------

3.4.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,835,220 ක් වටිනා වත්කම් වර්ග 6 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

3.5 ප්‍රසම්පාදනය
----------------

3.51 ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.16,492,573 ක ප්‍රාග්ධන වියදම දරා තිබුණද සභාව විසින් ප්‍රසම්පාදන සැලස්මක් සකස් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු අතර, නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වැය විෂයන් 20 ක් සඳහා සලසා දී තිබුණු රු.10,950,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයන් 34 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 14 සිට සියයට 97 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයන් 11 ක් සඳහා ඇස්තමේන්තුගත රු.24,260,000 ක ආදායමෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ඇ) ආදායම් විෂයන් 13 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 19 සිට සියයට 98 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විගණන සැලැස්මක් සකස් කර තිබුණද, සභාවේ සියලුම අංශ ආවරණය වන පරිදි විගණනය සිදුකරන කාලපරිච්ඡේද සඳහන් කර නොතිබුණි. වර්ෂය තුළදී විගණන වාර්තා 11 ක් පමණක් නිකුත්කර තිබූ නමුත් සභාවේ සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණනය සිදු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව | |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය නොකිරීම. |
| | | (ii) | ඉඩම් විධිමත් අනුමැතියකින් තොරව බදුදීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | සභාව සතු සියළු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | අවසන් තොගය නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| | | (iii) | ලැබිය යුතු ආදායම නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| (ඇ) | මුදල් හා බැංකු කටයුතු | (i) | අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| (ඈ) | වාහන පාලනය | (i) | ධාවනයෙන් ඉවත් කර තිබූ වාහන අපහරණය නොකිරීම. |
| | | (ii) | වාහන හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඉ) | ආදායම් පාලනය | (i) | කඩ කාමරවල කුලී තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) | කාලීනව වරිපනම් බදු තක්සේරු නොකිරීම. |
| | | (iii) | හිඟ ආදායම් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඊ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | ණයගැති ශේෂයන් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | ණයහිමි ශේෂ පියවීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | ණයගැති සනාථ කිරීම් ලබා නොගැනීම. |